# නීතියෙහි අනාගතය?

## ලහිරු මාධව වීරසිංහ*

**නීතිය යනු පොදු හෘදය සාක්ෂ්‍යයයි - තෝමස් හෝබ්ස්**

වර්තමානය වන විට දිනෙන් දින හෝරාවෙන් හෝරාව අකටයුතුකම්, අපරාධ සිදුවන සීඝ්‍රතාව ඉහළ යමින් පවතින ආකාරය ඇස්පනාපිටම අපට පැහැදිලිය. සාහසික මානසිකත්වය උත්තේජනය වන සමාජ ක්‍රමය තුළ අපරාධකරුවන් නීතියේ මාදැලෙහි රිංගා යාමට හැකි පැල්මවල් වලින් රිංගා යාමට නොනවතින උත්සහයක යෙදී සිටී. විටින් විට එසේ සොයාගත් පැල්මවල් හරහා ඔවුන් රිංගා බේරී යනුද පෙනේ. එවන් සිදුවීම් මගින් අනතුරට භාජනය වන්නේ මුළු මහත් මිනිස් සමාජයමය. අනෙක් අතට සමහර අවස්ථාවල අපරාධ මානසිකත්වයක් නොමැති පුද්ගලයන් ද දඬුයම් නොලැබිය යුතු වරදට දඬුවම් ලබනු දැකිය හැක. එය අභාග්‍යයට කරුණකි. සිවිල් සමාජය තුළද යම් යම් පිරිස් නීතියේ ඇති සමහර ප්‍රතිපාදන හේතුවෙන් අගතියට පත් වී සිටින අවස්ථා දැකගත හැකිය. මේ හේතුවෙන් අපේ රටේ පවතින නීතිය තුළ යම් යම් යාවත්කාලීන වීම් සිදුවිය යුතු බවට පැහැදිලි වේ. එසේ සිදුවිය යුතු යැයි අනුමාන කළ හැකි යාවත්කාලීන වීම් කිහිපයක් මෙසේ දැක්විය හැක.

## අපරාධයක් හෝ හානියක් වැළැක්වීමට තිබියදී ක්‍රියාත්මක නොවීම.

මහා විනාශයක් වැළැක්වීමට අවස්ථාව තිබියදී ක්‍රියාත්මක නොවීම නිසා අනිසි හානි සිදුවීම කොතෙකුත් සමාජයේ දක්නට ලැබේ. එවන් අවස්ථාවක නිවැරදිව ක්‍රියාත්මක වීමෙන් සිදුවන හානිය අවම කිරීම සමාජයේ වගකීමකි.

මහ මග සිදුවන අනතුරුවලදී තුවාලකරුවන් රෝහල්වලට ඉක්මණින් ප්‍රවාහන නොකිරීම රට තුළ කොතෙකුත් දැකිය හැකි සිදුවීමකි. එවන් අවස්ථාවක තුවාලකරුවන් ප්‍රවාහනය කරන රථයේ රියදුරුද උසාවි පොලිසි වල රස්තියාදු වීමට සිදුවේ යැයි කියමින් එවන් අවස්ථා මගහරින පුද්ගලයින් නිතර දෙවේලේ දැකගත හැකිය.

පසු ගිය දිනක බීමත් පුද්ගලයින් දෙදෙනෙකු මහමග අවසිහියෙන් සටන්වැදී එකෙකු එල්ලකරන පොලු පහරකින් අනෙක් පුද්ගලයා මියගිය වීඩියෝ පටයක් ප්‍රවෘත්ති වැඩ සටහන්වල විකාශනය විය. එය වැළැක්වීමට ඕනෑතරම් පිරිසක් එම ස්ථානයේ සිටියත් කිසිවෙකුත් එය වැළැක්වීමේ කිසිඳු උත්සාහයක් දරනු නොපෙනුනි.

මෙවන් අවස්ථාවල සමාජය අනතුර වැළැක්වීමට වඩා තම ජංගම දුරකථන වලින් ඡායා වීඩියෝ ගත කර සමාජමාධ්‍ය වල පතුරුවාහැරීමට උත්සුක වීම මිනිසුන් ලෙස අප ලැජ්ජාවට පත්විය යුතු අවස්ථාවකි. අනතුරක්, විනාශයක් වැළැක්වීමට අවකාශය තිබේනම් එය වැළැක්වීම සමාජ වගකීමකි. අවි ආයුධ අතින්ගත් පුද්ගලයින් මෙල්ල කල යුතු බවක් මෙහිදී අදහස් නොවේ. නමුත් එදිනෙදා අප දකින අවස්ථාවන්ගෙන් බොහොමයක් ඉතා සුළු පරිශ්‍රමයක් යොදා වැළැක්වීමට හැකි අවස්ථා බව දැකගත හැකිය. එවන් අවස්ථාවල තම සමාජ වගකීම ඉටුනොකරන පුද්ගලයින් සඳහා ක්‍රියාත්මක කිරීමට යම් නීති රාමුවක් සැකසීම කාලීන අවශ්‍යතාවයකි.

අනෙක් අතට මෙවන් අවස්ථාවලදී පුද්ගලයින් ලබාදෙන තොරතුරු අනුව ක්‍රියාත්මක විය යුතු රජයේ අදාළ අංශ හැකි උපරිම කාර්යක්ෂමතාවයකින් ක්‍රියා කිරීමට වගබලාගත යුතුව ඇත. බොහෝ අවස්ථාවලදී පොලිස් හදිසි ප්‍රතිචාර අංශ, ගිනි නිවීමේ අංශ ආදිය ක්‍රියාත්මක වන විට සිදුවීමට ඇති සියල්ල සිදුවී හමාරය. සමාජය තම වගකීම නිසිලෙස ඉටුකරන අතරතුර රජයේ වගකිව යුතු අංශ සමාජය සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ක්‍රියාකිරීමෙන් අපරාධ හා සිදුවන විනාශයන්ගෙන් අඩකට වඩා වැළැක්වීමේ හැකියාව පවතී. නිය පිටින් කඩා දැමිය හැකි දේ පොරොවෙන් කැපීමට

---

* නීති ශිෂ්‍ය, පළමු වසර, ශ්‍රී ලංකා නීති විද්‍යාලය

©All rights reserved

ISSN 1800-055X Vol. Iv

MANURAWA 2020

සිදුවනතෙක් නොහිද ක්‍රියාකිරීම සැමගේ වගකීම බව අවබෝධ කරගත යුතුය.

## ගබ්සාව නීතිගත කිරීම

වගකීම් විරහිත වර්ථමාන සමාජය තුළ සාමාන්‍ය ගබ්සාව සඳහා නීත්‍යානුකූල ආරක්ෂිත ප්‍රතිපාදන සලසා නොමැති බැවින් අදාළ පුද්ගලයින් පමණක් නොව මුළු මහත් සමාජයට අගතියට පත්වන අවස්ථා කොතෙකුත් පවතී.

ගබ්සාවක් අවශ්‍ය වූ පුද්ගලයින් නීත්‍යානුකූල වුවත් නැතත් ඒ සඳහා යොමුවන බව ස්ථිර කරුණකි. නීත්‍යානුකූල ක්‍රමවේද නොමැති ශ්‍රී ලංකාව වැනි රටක ඒ සඳහා ඔවුන්ට තෝරාගත හැකි මාර්ග නම් වංචනික වෛද්‍යවරු සහ අනතුරු දායක ගබ්සා ඖෂධ අලෙවි කරන ජාවාරම්කරුවන් වීම අන්තරාය තීව්‍රකරයි. හොර රහසේ මෙවන් ගබ්සා කිරීම සිදුකරන වෛද්‍යවරු ඒ සඳහා නිසි පුහුණුවක් නොලැබූවන් වීම අදාළ සේවාව ලබාගන්නා කාන්තාවන්ගේ ජීවිත සමහර අවස්ථාවලදී මරණය දක්වා වූ අන්තරායකට හෙළනු ලබයි. මෙවන් ජීවිත අවධානමක් ගැනීමෙන් සහ සිදුවන වැරදීම් හේතුවෙන් සදාකාලික අබාධවලට ලක්වීමෙන් අගතියට පත්වන්නේ අදාළ ගර්භනී කාන්තාව පමණක් නොව ඔවුන්ගේ පවුල්වල පිරිස් ඇතුළු මුළු මහත් සමාජයට මේ හේතුවෙන් අගතියට පත් වේ.

නීත්‍යානුකූල ගබ්සාවක් කරගත නොහැකි කාන්තාව කොටුවන්නේ ගිජුලිහිණි රැලකටය. කළ දුටු කල වල ඉහගන්නට මොවුන් මඳකුදු පසුබට නොවේ. ගබ්සා සැත්කමකට ලක්ෂ ගණනක මුදලකුත්, ගබ්සා ඖෂධ සඳහා තිස් හතළිස් දහසින් මුදලුත් ලබාගන්නේ අදාළ කාන්තාවන්ගේ පිළිසරණක් නොමැති අසරණ බව ප්‍රයෝජනයට ගනිමිනි. එම අවස්ථාවල එම වංචනිකයින් විසින් එම කාන්තාවන්ගේ ජීවිතය රැඳී පවතින්නේ තමාගේ දෑතේ බව දැන දැනම ඇයගේ ජීවිතයත් අනතුරේ හෙළමින් යම් අනතුරක් සිදුවුවහොත් තමාට නීතිය ඉදිරියේ මුහුණ දීමට සිදුවන දඩුවම්ද නොසලකා හරිමින් කටයුතු කරන්නේ මිනිස් ජීවිත වලට වඩා මුදල් අගනා බව ලොවට විදහා දක්වමිනි.

අනෙක් අතට ගබ්සා කිරීමට අවශ්‍ය වුවත් එසේ නොකිරීමෙන් උපදින් දරුවන්ගේ අනාගත ඉරණම කුමක් ද? එම දරුවා දෙමාපියන්ගෙන් ප්‍රතික්ෂේප වන්නේ මෙලොවට බිහිවීමටත් පෙරාතුවය. එම දරුවා කුස පිළිසිඳගත් කාලයේම දෙමාපියන්ට අනවශ්‍ය වස්තුවක් බවට පත්වී හමාරය. ඔහු හෝ ඇය මෙලොව එළිය දැකීමෙන් පසු කිසිඳු සුගතියක් අත්වේයැයි කිවහැක්කේ කාහටද? බොහෝ අවස්ථාවල එම දරුවාට තම පවුල තුළ නොයෙක් දුක් කම්කටොළු මධ්‍යයේ දුක්ඛිත ජීවිතයක් ගතකරමින් සමාජයෙන් කොන් වී ජීවත් වීමට සිදුවේ. නැතහොත් කානුවක හෝ ත්‍රී රෝද රථයක් තුළ අතහැර දැමෙන දරුවාට තම දෙමාපියන් කවුද යන්නවත් නොදැන තම සුන්දර ළමා විය ආදරය සෙනෙහස අහිමි ළමා නිවාසයක ගෙවා කිසිඳු ඥාතියෙක් නොමැතිව සමාජය වෙත පියනැගීමට සිදුවනු ඇත. සුළභ නොවුවත් දුලභද නොවන සමහර අවස්ථාව ඉපදුන ළදරුවන් මරා දැමුනු අවස්ථාද දැකිය හැක. ඉපදීමට පෙර මරාදැමීමට නොහැකි වූවානම් ඉපදුන පසු හෝ මරා දැමීමට කටයුතු කරන මිනිසුන් දරුවකුගේ මිනිස් ජීවිතයේ අගය නොදන්නා බව නිසැකය. ගබ්සාව යනු සර්ව සම්පූර්ණ පිළිතුරක් නොවූවත් දෙමාපියන්ගේ වගකීම් විරහිත භාවයෙන් උපදින දරුවකු ඉහත අවස්ථාවලට මුහුණදීමට සැළැස්වීමට වඩා ගබ්සාව ප්‍රායෝගික පිළිතුරක් බව පැවසිය හැක.

ස්ත්‍රී දූෂණය වීමක් හේතුවෙන් කාන්තාවක් ගැබ් ගැනීම අති විශේෂ අවධානය යොමු කළයුතු අවස්ථාවකි. මෙහිදී අගතියට පත් කාන්තාව වෙනුවෙන් වන්දි ගෙවීමට සහ සිදුකළ අපරාධය වෙනුවෙන් දඩුවම් විඳීමට ස්ත්‍රී දූෂණය සිදුකළ පුද්ගලයාට සිදුවේ. නමුත් ඔහුගේ ක්‍රියාව හේතුවෙන් අදාළ කාන්තාව මවක් වීම වැලැක්වීමට ක්‍රියාපටිපාටියක් නැතිවීමට හේතුව කුමක් ද? මෙවන් අවස්ථාවකදීවත් ගබ්සා කිරීමත් නීත්‍යානුකූල නොවන්නේ කුමන හේතුවක්මත ද? ස්ත්‍රියකගේ ජීවිතය බේරාගැනීමට ගබ්සාවක් සිදුකිරීමේ ප්‍රතිපාදන දණ්ඩ නීති සංග්‍රහයේ 303 වගන්තිය යටතේ සලස්වා ඇත. වෛද්‍ය විද්‍යාත්මක හේතුවකින් පමණක් කාන්තාවකගේ ගබ්සා කිරීම නීතිගත කොට සමාජ විද්‍යාත්මක කරුණකදී ගබ්සාව නීත්‍යානුකූල නොකිරීම හාස්‍යජනක නොවේ ද? තමාව දූෂණය කරන ලද පුද්ගලයාට අයත්

MANURAWA 2020

©All rights reserved

දරුවෙකු මෙලොවට බිහිකිරීම ඇයගේ මුළුඉදිරි ජීවිතයටම විනාශයක් නොවන්නේ ද?

දරුවෙකු මෙලොවට බිහි කිරීමේ සම්පූර්ණ වගකීම අදාල කාන්තාව සතුවේ. එම ක්‍රියාවලිය තුල ඇය විසින් දරාගන්නා දුක, කැපවීම ආදියෙන් කොටසක් ගබ්සාව වැලැක්වීම වෙනුවෙන් නීති සම්පාදනය කරන ලද හෝ එම නීති ක්‍රියාත්මක කරන පුද්ගලයින් විසින් බාරගනු ඇතැයි අපේක්‍ෂා කළ නොහැක. අවසාන වශයෙන් ඇසීමට ඇති ප්‍රශ්නය නම් කාන්තාවගේ කැමැත්ත නොමැතිනම් මාස ගණනක් වැය කරමින් තම ශරීරය, ඇට, මස්, නහර වැය කරමින් මෙලොවට දරුවෙක් බිහිකරන ලෙස බල කිරීමට වෙනත් කිසිඳු පුද්ගලයෙකුටඇති අයිතිය කුමක් ද යන්නයි.

## මාධ්‍ය මගින් පුද්ගල අනන්‍යතාවයට සිදුකරන හානි

අද වන විට නිවසක රූපවාහිනී යන්ත්‍රය ක්‍රියාත්මක කරත්, ජංගම දුරකථයකින් ෆේස්බුක් වෙබ් අඩවියකට පිවිසුනත් වෙනත් මොනයම් හෝ සමාජ මාධ්‍යක් වෙත පිවිසුනත් එක් පොදු ලක්ෂණයක් දැකගැනීමට හැකිය. එය නම් විවිධ මාධ්‍ය කණ්ඩායම් සමාජ අවධානය දිනාගැනීමේ අරමුණින් පුවත් මැවීමේ නොතිත් තරගයක යෙදී සිටීමයි. සිත් ඇදගන්නා සුළු, නමුත් නොමග යවන පුවත් ශීර්ෂ යොදා ගනිමින් උදේ හවස පුද්ගලයන් වෙත පැමිණෙන පුවත් බොහෝය.

ප්‍රශ්නය මතුවන්නේ රසවත් පුවත් මැවීම සඳහා මෙවන් පිරිස් පුද්ගලඅනන්‍යතාවයට හානි වන සුළු තොරතුරු යොදා ගැනීමයි. රටෙහි වගකිවයුතු කීර්තිමත් යැයි කියාගන්නා මාධ්‍ය ආයතන පවා මෙසේ නිර්ලජ්ජිත, වගකීම් විරහිත අයුරින් පුද්ගල අනන්‍යතාව රටක් ඉදිරියේ වෙන්දේසි කරන්නේ තම ආයතනයට ඇති ප්‍රේක්ෂක ආකර්ශනය වැඩිකර ගැනීමේ එකම අරමුණ පෙරදැරි කරගෙනය.

මාධ්‍ය හැඳුනුම්පත දඩමීමා කරගනිමින් තමාට අදාල නොවන අන් මිනිසුන්ගේ පුද්ගලිකත්වයට අත පොවන මාධ්‍යවේදීන්ට විරුද්ධව විශේෂ පියවර ගැනීම තවත් අත්‍යවශ්‍ය කරුණකි. මෙවන් අවස්ථාවලදී ඇති හැකි අය නීතියෙන් පියවර අරගන්නා නමුත් සාමාන්‍ය මිනිසුන් බොහෝවිට මේ අකටයුතුකම් ඉදිරියේ නිහඬව සිටී. ඒ හේතුවෙන් සමස්ථයක් වශයෙන් ගත්කල පොදු මහජනතාවගේ පුද්ගලිකත්වය සුරැකීම සඳහා විශේෂ සීමාකිරීම් මාධ්‍ය ආයතන වලට පැනවිය යුතු අතර සමාජ මාධ්‍ය භාවිතයෙන් සිදුවන ප්‍රතිරූප හානිකිරීම් වැලැක්වීමටද වගකිවයුත්තන් විසින් නිසි පියවර ගත යුතුය. අවම වශයෙන් සහනාධාර ලබාගන්නා පුද්ගලයකුගේවත් මුහුණ ජන මාධ්‍ය තුළ විකාශනය නොවන ආකාරයෙන් පුද්ගලිකත්වය සුරැකිය යුතුය.

සමාජ මාධ්‍ය සහ අන්තර්ජාල පණිවුඩ සේවා හරහා සිදුවන ලිංගික හිංසනයද අද වන විට ඉතා උපරිම මට්ටමකට පැමිණ ඇත. යම් පුද්ගලයකුට අයත් පුද්ගලික නිරුවත් ඡායාරූප, වීඩියෝපට ආදිය සමාජ මාධ්‍යකට මුදාහැරුන අවස්ථාවකදී කිසිසේත් පාලනය කරගත නොහැකි ලෙස මුළු මහත් සමාජය තුලම පැතිරී යයි. මිනිසුන්ට අයත් පුද්ගලිකත්වය ඉන්පසු පොදු දේපලක් ලෙස අවභාවිතාවට ලක්වේ. අවසානයේ අදාළ පුද්ගලයින්ට සහ ඔවුන්ගේ සමීපතමයන්හට සමාජයට මුහුණදීමට නොහැකිවන ලෙසට සමාජය විසින්ම පීඩනයට ලක් කරයි. මෙසේ එල්ලවන මානසික පීඩනය දරාගත නොහැකිව සිදුවන සියදිවි හානිකර ගැනීම් කොතෙකුත් දැකගත හැකිය.

තවදුරටත් ව්‍යාජ ලෙස ඡායාරූප විකෘති කිරීමෙන් සහ අන් සතු ඡායාරූප භාවිතා කර සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යෑමෙන් පුද්ගලයකුගේ චරිතය හිතාමතා ඝාතනය කිරීම අද වන විට සාමාන්‍ය තත්වයක් බවට පත් වන තරමට බහුලව සිදුවේ.

මෙවා වැලැක්වීම සඳහා පවතින නීති යාවත්කාලීන වීම පමණක් ප්‍රමාණවත් නොවන අතර අදාල නීති ක්‍රියාත්මක කරන අංශද කාර්යක්ෂමව ක්‍රියාකල යුතුය. සියළු දෙනා තේරුම්ගත යුතු එක් දෙයක් ඇත්නම් ඒ නීති මගින් තමා සීමා කිරීමට වඩා තමාම ස්වයං පාලනයකින් යුතුව ක්‍රියාත්මක වීමෙන් තමාටත් සමාජයටත් සිදුවන හානිය අවම වන බවයි. යමක් සිදු කිරීමට පෙර තමා උපමාකර සිතා බලා ක්‍රියාකලානම් සමාජය සැමට සොඳුරු ස්ථානයක් වනු නියතය.

MANURAWA 2020

©All rights reserved

## බරපතළ තුවාල සිදුකිරීම සහ මිනීමැරීම අතර පරතරය

මිනීමැරීමේ වරදට මරණීය දඬුවමින් දඬුවම් ලැබෙන නමුත් බරපතල තුවාළ සිදුකිරීමට ලැබෙන දඬුවම වසර කිහිපයක සිර දඬුවම් පමණි. නමුත් මේ අවස්ථා දෙක අතර එතරම් වෙනසක් නැති බව පැහැදිලිව අධ්‍යයනය කල විට පෙනේ.

උදාහරණ වශයෙන් බරපතල තුවාල සිදුවන පිහි ඇනුමක් සලකමු. මෙම පිහිපහර මරණීය නොවන්නේ මිලීමීටර කිහිපයක පරතරයකින් විය හැකිය. ප්‍රශ්නය ඇතිවන්නේ මෙම පිහිපහර එල්ල කරන ලද පුද්ගලයා කුමන ආකල්පයකින් පිහිපහර එල්ල කරන ලද්දේද යන්නයි. නමුත් අපට ප්‍රත්‍යක්ෂ වන එක් කරුණක් නම් මරණය සිදුවන ප්‍රමාණයට මදක් මෙපිටින් පිහිය නැවතුයේ අපරාධකරු සචේතනිකව නොවන බවයි. පැහැදිලිවම ඔහු පිහි පහර එල්ල කිරීමේදී එයින් තුවාලකරු මිය යා හැකි බව නොදැන සිටියේයැයි පැවසිය නොහැක. තවදුරටත් පැහැදිලි කලහොත් බරපතල තුවාල සිදුවන සේ හිසට එල්ල කරන ලද පොලු පහරක් තවත් අඟලක් එහා මෙහා වී මරණය සිදුනොවෙතැයි කාටනම් කිව හැකි ද?

මෙහිදී සැලකිය යුතු කරුණ වන්නේ මරණයක් සිදුවීමට ඉතා ආසන්න බරපතල තුවාලයක් සිදුකරනු ලැබුවෙකු හට මරණය සිදුනොවීමේ වාසිය ලබා නොදිය යුතුය යන්නයි. ඔහු එම ක්‍රියාව සිදුකිරීමේදී මරණය වුවත් අත්විය හැකිය යන චේතනාවෙන් යුතුව එය සිදුකරන ලදි. ඔහුත් මිනීමරුවෙකුත් අතර ඇත්තේ ඉතා සුළු පරතරයක් බැවින් මිනීමැරුමට අදාළ දඬුවමෙන් බොහෝ දුරස්ථ දඬුවමක් ලබා ගැලවී යාමට ඉඩ හැරිය යුතු නොවේ.

## මානුෂීය හේතුමත සොරකම

තෝරු, මෝරු හසුනොවන නීතියේ දැලට හාල්මැස්සන් පමණක් හසුවන බව නිතර දෙවේලේ සමාජයේ රැව්දෙන කාරණාවක් බවට පත් වී ඇත. සත්‍ය වශයෙන්ම මෙම කියමන අහේතුක නොවන බව පෙනේ. බිලියන ගණනින් ජනතා මුදල් කොල්ලකන බල පුලුවන් කාරයින් නීතියට ද දේශපාලන බලපෑම් එල්ල කරමින් දඬුවම් වලින් බේරීමට විදේශගත වෙමින් කට්ටි පනිනු දැකගත හැක. අනෙක් පසින් තම දරුවන්ගේ කුසගිනි නිවීමට සුළු සොරකමක් කල පුද්ගලයෙකු දඩ මුදල් ගෙවාගත නොහැකිව මාස ගනනක් සිරගතවීමසිදුවන අවස්ථාද දැකිය හැක.

මෙවන් අවස්ථාවලදී අන්ත දුගී භාවය හේතුවෙන් සොරකම් කරන පුද්ගලයෙකුට දඩමුදල් ගෙවාගැනීමේ හැකියාවක් ඇති බව අපේක්ෂා කල නොහැක. අඩු ආදායම් ලාභීන්ට දඩ මුදල් ගෙවාගැනීම පහසු කිරීම සඳහාද යම් ප්‍රතිපාදනයක් සැලසිය යුතුව ඇත.

මක්නිසාද යත් එවන් අවස්ථාවක අදාළ පුද්ගලයා සිරගත කිරීමෙන් ඔහු පමණක් නොව බොහෝ විට ඔහුට අයත් මුළු දරු පවුලම තවත් අභාග්‍යට වැටෙන නිසාවෙනි. සුළු සොරකමක් වැනි දෙයක් සිදුකල පුද්ගලයෙක් නීතිය ඉදිරියට පැමිණ වීමෙන් පසු ඔහු එම සොරකම සිදුකලේ සත්‍ය වශයෙන්ම නැති බැරි කම හේතුවෙන්දැයි සොයා බැලිය යුතුය. මක් නිසාද යත් අද සමාජයේ මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් මත්ද්‍රව්‍ය මිලදී ගැනීමට මුදල් සොයාගැනීම සඳහා නිරතුරුව සොරකම් වල නියැලෙන බැවිනි.

එසේ සොරකම සිදුකලේ නැති බැරි අසරණ බාවය සඳහා පමණක් යැයි ඔප්පු වූ අවස්ථාවක එම පුද්ගලයාට රජය විසින් සමෘධි ආධාර වැනි යම් සහනයක් ලැබී නැතිදැයි සොයා බැලිය යුතුය. අද වන විට එසේ ආධාර ලබා දීම්ද දේශපාලනීකරණය වී ඇති අතර ආධාර අත්‍යාවශ්‍ය නොවන පුද්ගලයින් ආධාර ලබාගන්නා අතර සත්‍ය වශයෙන්ම ආධාර අවශ්‍ය පුද්ගලයින්ට කිසිත් නොලැබෙන අවස්ථාද බහුලව දක්නට ලැබේ.

එහිදී අදාළ පුද්ගලයාට එසේ ආධාර කිසිවක් නොලැබෙන්නේ නම් අවවාද ලබාදී, අවශ්‍ය ආධාර එම පුද්ගලයාට ලැබෙන තැනට කටයුතු සලසා දීමෙන් එම පුද්ගලයාව තවදුරටත් සොරකම් කිරීමේ අවශ්‍යතාවක් නොමැති පුද්ගලයෙකු බවට පත් කිරීමඵලදායී මාර්ගයකි.

MANURAWA 2020

©All rights reserved

## නිල ඇඳුමේ මුවාවෙන් සිදුකරන අපරාධ

යම් රටක රජය විසින් යම් රජයේ නිලධාරියෙක් පත් කරන්නේ ජනතාව වෙනුවෙන් යම් කාර්යයක් ඉටුකර පොදු ජන යහපත ස්ථිර කිරීමටයි. නමුත් තුන්වන ලෝකයේ රටවල නිලධාරීන් විසින් නොයෙක් අවස්ථාවල තම නිලයේ බලය පුද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා භාවිතා කිරීම සහ අත්තනෝමතිකව නිල බලය භාවිතා කිරීම කොතෙකුත් සිදුවේ.

විශේෂයෙන්ම පොලිස් අත්අඩංගුවේ සිටින පුද්ගලයන් මරා දැමීම නින්දිත කරුණකි. ‘ආයුධ පෙන්වීමට රැගෙන යන පුද්ගලයින් පොලිස් නිලධාරීන් වෙත අදාල ආයුධ වලින් පහර දීමට උත්සහ කිරීමේදී පොලිස් වෙඩි පහරින් මියයාම’ මාධ්‍ය හරහා කොතෙකුත් අසන්නට ලැබෙන කරුණකි. දැඩි පොලිස් රැකවල් මත රැගෙන යන මෙම සැකකරුවන් මාංචු යොදා දෙපසින් පොලිස් නිලධාරීන් විසින් අල්ලාගෙන සිටින අතරතුර එසේ ආයුධ ප්‍රහාර එල්ල කිරීම විශ්මයජනක කරුනකි. මෙවන් අවස්ථාවලදී අපරාධ කාරයෙකු බැවින් එසේ කිරීමට සුදුසු බව සමාජය විසින්ද අනුමත කිරීම හාස්‍යජනක අනුවනකමකි. අපරාධකරුවෙකුට දඬුවම් නියම කිරීමට අයිතිය ඇත්තේ අධිකරණයට පමණි. පොලිසියට එවන් බලයක් නොමැත. ඉහත සඳහන් ආකාරයේ අවස්ථාවකදී පොලීසිය සිදුකරන ලද ක්‍රියාව සමාජය විසින් සාධාරණීකරනය කිරීමෙන් සිදුවන්නේ ඉන්පසු අවස්ථාවලදී අපරාධකාරයින් නොවන පුද්ගලයින්ට පවා හානි කිරීමට එම නිලධාරීන් පසුබට නොවීමයි.

සමාජ යහපත වෙනුවෙන් පත්කරන ලද නිලධාරීන් විසින් එම නිල ඇඳුමේ බලතල යොදාගෙන සිදුකරන අපරාධ සාමාන්‍ය පුද්ගලයෙකු විසින් එම අපරාධයට සිදුකරන අවස්ථාවට වඩා අතිශයින් බරපතලය. එහෙයින් මෙවන් නිලධාරී අපරාධ වැලැක්වීම සඳහා විශේෂ නීති පද්ධතියක් සහ ඒවා සොයා බලා ක්‍රියාත්මක කිරීමට විශේෂ ආයතනත් පිහිටුවීම අත්‍යාවශ්‍ය කරුණකි.

## දික්කසාද වීමේ ප්‍රතිපාදන

ශ්‍රී ලංකාවේ පවත්නා සාමාන්‍ය නීතිය යටතේ යම් විවාහක යුවළකට දික්කසාද වීම සඳහා විශේෂ අවශ්‍යතා කිහිපයක් සම්පූර්ණ කලයුතු වෙයි. එනම් එක් පාර්ශවයක් අනාචාරයේ හැසිරීම, ද්වේශ සහගත හැරයාම සහ විවාහවන අවස්ථාවේ පවත්නා සුවකල නොහැකි ලිංගික බෙලහීනතාවයයි. මෙම කරුණු සම්පූර්ණ නොවන අවස්ථාවලදී දික්කසාද වීම පහසු කරුණක් නොවේ.

නමුත් වර්තමාන සංකීර්ණ සමාජක්‍රමය තුළ පුද්ගලයින්ට සාධාරණ වශයෙන් දික්කසාද වීමට තවත් ඕනෑතරම් හේතු දැකිය හැකිය. දික්කසාදවීමේ අවශ්‍යතාවය ඇති පිරිස් නීතිමය බාධක හේතුවෙන් තවදුරටත් විවාහය තුළ රඳවා තැබීම ප්‍රශ්න රැසකට මුල්වන්නකි. කල්යැමේදී මෙම වෙන්වීමේ උවමනාව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය දක්වා ඉහළ යෑමේ අවදානමක් පවතී. සත්‍ය වශයෙන්ම නීති පැවතිය යුත්තේ පුද්ගලයින්ට පහසුව සැලසීමට විනා වෙන්වන පුද්ගලයින් බලෙන් බැඳ තැබීමට නොවිය යුතුය.

දෙදෙනෙකු විවාහ වන්නේ තම කැමැත්ත සහ අභිමතය පරිදිය. එලෙසින්ම විවාහවීම නුසුදුසු යැයි ඔවුන්ට හැඟේනම් දික්කසාදවීමේ අයිතියද ඔවුන්ට තිබිය යුතුය. විවාහක යුවලකට තවදුරටත් විවාහය පවත්වාගැනීමේ අවශ්‍යතාවයක් නැතිතැන විවාහ සහතිකය යනු අර්ථ ශුන්‍ය කඩදාසි කැබැල්ලක් පමණි. එවන් අවස්ථාවක දික්කසාද වීමට නීතිමය බාධා ඇතිවීමෙන් අදාළ පුද්ගලයින් මානසික පීඩනයට පත්වීම, අදාළ පාර්ශවය දුරාචාර අනාචාර ආදියට යොමුවීම වැනි දේ සිදුවීමේ ප්‍රවනතාවය වැඩිවේ.

එහෙයින් විවාහය අවශ්‍ය අවස්ථාවේ නිදහසේ විවාහවීමට ඉඩසැලසීම මෙන්ම දික්කසාද වීමට අවශ්‍ය මොහොතේ අනවශ්‍ය බාධා කිරීම් වලින් තොරව ස්වකැමැත්තෙන් වෙන්වීමට හැකිවනසේ ද නීති ලිහිල් කිරීම සුදුසුය.

## මූලාශ්‍ර


- දණ්ඩ නීති සංග්‍රහය
- Marriage Registration Ordinance


MANURAWA 2020

©All rights reserved